# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1788/8 - 2012 දෙසැම්බර් මස 11 වැනි අඟහරුවාදා - 2012.12.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

### බස්නාහිර පළාතේ පළාත් සභාව

1989 අංක 12 දරන පළාත් සභා ආනුෂාංගික විධිවිධාන පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු
1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 123 (1) වැනි වගන්තිය
යටතේ පළ කරනු ලබන නිවේදනය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 126 (xiv) වගන්තිය සමග කියවිය යුතු එකී පනතේ 122 වන වගන්තියෙන් අත්තනගල්ල ප්‍රාදේශීය සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එකී ප්‍රාදේශීය සභාව විසින් සාදනු ලැබ, මෙහි පහත දැක්වෙන අතුරු ව්‍යවස්ථාව 2010 සැප්තැම්බර් මස 28 වැනි දින පැවති අත්තනගල්ල ප්‍රාදේශීය සභා මහා සභා රැස්වීමේ සම්මුති අංක 03(i) දරන යෝජනාවෙන් සම්මතය ලබා ඇත. 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂාංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු ඉහත කී, ප්‍රාදේශීය සභා පනතේ 123 (1) වැනි වගන්තිය ප්‍රකාර එකී අතුරු ව්‍යවස්ථාව බස්නාහිර පළාතේ, පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, විදුලිබල හා බලශක්ති, මිනිස් බල හා රැකීරක්ෂා වෙළඳ, ආර්ථික ප්‍රවර්ධන පිළිබඳ අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මා විසින් අනුමත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ප්‍රසන්න රණතුංග,
බස්නාහිර පළාතේ, පළාත් සභාවේ, ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රම සම්පාදන,
නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන,
විදුලිබල හා බලශක්ති, මිනිස් බල හා රැකීරක්ෂා හා
වෙළඳ, ආර්ථික ප්‍රවර්ධන පිළිබඳ අමාත්‍ය.

2012 නොවැම්බර් මස 28 වැනි දින,
කොළඹ 07, ශ්‍රාවස්ති මන්දිරයේ පිහිටි,
බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍යාංශයේ දී ය.

### ආදාහනාගාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව

1. මෙම අතුරු ව්‍යවස්ථාව අත්තනගල්ල ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාර පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. අත්තනගල්ල ප්‍රාදේශීය සභාවට අයත් ආදාහනාගාරවල මෘත ශරීර ආදාහනය කිරීම, ඒ සඳහා ගාස්තු නියම කිරීම හා ගාස්තු අය කිරීම සහ ආදාහනාගාරය පාලනය විධිමත් කිරීම සඳහා මෙම අතුරු ව්‍යවස්ථා පනවනු ලැබේ.

1A - PG 001475 — 365 (2012/12)

3. සභාපතිවරයා විසින් හෝ ඔහු විසින් බලය පවරන ලද නිලධාරියෙකු විසින් නිකුත් කරන ලද අවසර පත්‍රයක් නොමැතිව සභාව සතු ආදාහනාගාරයක කිසිම මෘත ශරීරයක් ආදාහනය නොකළ යුතු ය.

4. තුන්වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් අවසර පත්‍රයක් ලබා ගැනීමට අපේක්ෂා කරන (මෙහි මින්මතු ඉල්ලුම්කරු යයි සඳහන් කරනු ලබන) තැනැත්තෙකු විසින් "අ" උපලේඛනයට සාරානුකූලව පිළියෙළ කරන ලද ඉල්ලුම්පත්‍රයක් පහත සඳහන් ලියවිලි සමග සභාපතිවරයා හෝ ඔහුගේ බලයලත් නිලධාරියෙකු වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය :–

(i) මියගිය තැනැත්තා සහ ඉල්ලුම්කරු අතර සම්බන්ධතාවය තහවුරු කරන ලියවිල්ලක්, ඉල්ලුම්කරු උප්පැන්න සහතිකය හෝ මියගිය අයගේ උප්පැන්න සහතිකය හෝ ඉල්ලුම්කරුගේ විවාහ සහතිකය හෝ මියගිය තැනැත්තා පදිංචිව සිටි ග්‍රාමසේවා කොට්ඨාසයේ ග්‍රාමසේවා නිලධාරි විසින් නිකුත් කරන ලද සහතිකයක් මේ සඳහා ප්‍රමාණවත් වේ.

(ii) මියගිය තැනැත්තාගේ මරණය සම්බන්ධයෙන් අපරාධ නඩු විධාන සංග්‍රහය යටතේ පරීක්ෂණයක් පවත්වනු ලද්දේ නම් පරීක්ෂණය පවත්වන ලද මරණ පරීක්ෂකවරයා හෝ මහේස්ත්‍රාත් විසින් උපත් හෝ මරණ ලියාපදිංචි කිරීමේ පනත අනුව 41(ඉ) වගන්තිය යටතේ මෘත ශරීරය ආදාහනය කිරීම සඳහා අවසර දෙමින් නිකුත් කරන ලද සහතිකය.

(iii) අජීවී උපතකින් බිහිකරන ලද මෘත ශරීරයක් නම්, උපත් හා මරණ ලියාපදිංචි කිරීමේ පනතේ 43 (1) වගන්තිය යටතේ නිකුත් කරන ලද සහතිකය.

5. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත්‍රය, සභාපතිවරයා වෙත භාරදෙනු ලැබීමෙන් පසු ලැබුණු අනුපිළිවෙල අනුව ලේඛනගත කළ යුතු වේ.

6. මෘත ශරීරය ආදාහනය කිරීම සඳහා භාරගනු ලබන්නේ නම් ඒ සඳහා නියමිත ගාස්තුව අයකරගෙන අවසර පත්‍රය ඉල්ලුම්කරු වෙත නිකුත් කරනු ලැබිය යුතු වේ. ආදාහනාගාර භාරකරු වෙත මෘත ශරීරය භාරදිය යුතු වේලාව අවසර පත්‍රයෙන් සඳහන් කළ යුතු ය.

7. මෘත ශරීරය ආදාහනය කිරීම සඳහා භාරගනු නොලබන්නේ නම්, ඒ බව එයට හේතු වූ කරුණු ද සමග ඉල්ලුම්කරුවා හට ලිඛිතව දැන්විය යුතු ය.

8. සෑම දිනක ම ප.ව. 12.00 සිට පස්වරු 07.00 දක්වා කාලය ඇතුළත ආදාහනය කිරීම සඳහා මෘත ශරීර භාරගනු ලැබිය හැක.

9. ඉල්ලුම්කරු අවසර පත්‍රයේ සඳහන් වේලාව හෝ එයට ප්‍රථම මෘත ශරීරය ආදාහනාගාර භාරකරු වෙත භාරදිය යුතු ය. ප්‍රමාද වී භාරදීම නිසා ඇතිවන අපහසුතාවයන් සහ අලාභයන් පිළිබඳව ප්‍රාදේශීය සභාව වගකීමට යටත් නොවිය යුතු ය.

10. සෑම ආදාහනාගාරයක ම ආදාහනය කරන ලද එක් එක් මෘත ශරීරය සම්බන්ධයෙන් ඉල්ලුම්කරුගේ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය, මියගිය අයගේ නම හා මිය යාමට ප්‍රථම පදිංචි ව සිටි ස්ථානයේ ලිපිනය හා ඉල්ලුම්කරු මියගිය තැනැත්තා සමග තිබූ සම්බන්ධතාවය, ආදාහනය සිදු කරන ලද දිනය හා වේලාව ආදී විස්තර ආදාහනාගාර භාරකරු විසින් ලේඛනගත කළ යුතු වේ.

11. මෘත ශරීරය ආදාහනය කර පැය 72 ක් ගත වීමට ප්‍රථම භස්මාවශේෂ ඉල්ලා සිටින ඉල්ලුම්කරු හෝ ඔහුගේ නියෝජිතයා භස්මාවශේෂ භාරගත යුතු වේ. නියමිත කාලය ඇතුළත භාරගනු නොලබන භස්මාවශේෂ කවරාකාරයකට හෝ බැහැර කිරීමට සභාපතිවරයාට හෝ බලයලත් නිලධාරීන්ට බලය තිබිය යුතු ය.

12. ආදාහනාගාර භාරකරුගේ හෝ සභාපතිවරයාගේ අවසරය නොමැති ව ආදාහනාගාර පරිශ්‍රයට ඇතුළුවීම වරදකි. එසේ වුවද මෘත ශරීරයක් ආදාහනය කිරීම සඳහා අවසරපත්‍ර ලාභියකු සමග පැමිණෙන තැනැත්තෙකුට හෝ තැනැත්තන්ට ඒ සඳහා අවසර දී ඇති ලෙස සලකනු ලැබිය හැක.

13. ආදාහනාගාර පරිශ්‍රය තුළ සාමය කඩවන ආකාරයට හැසිරීම හෝ ආදාහනාගාර පරිශ්‍රය තුළ පිහිටි සභාව සතු දේපළවලට අලාභහානි කිරීම හෝ ආදාහනාගාර භාරකරු හෝ ඔහුගේ සහායකයින් ගේ හෝ රාජකාරි කටයුතුවලට බාධා කිරීම හෝ ආදාහනාගාර පරිශ්‍රය තුළ සැරසිළි කිරීම නොකළ යුතු ය.

14. මෙම අතුරු ව්‍යවස්ථාවල 12 වැනි අතුරු ව්‍යවස්ථාවේ හෝ 13 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් වරද කිරීම සම්බන්ධයෙන් තැනැත්තෙකු නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් මගින් වරදකරු කරනු ලැබූ විට රු.750 නොඉක්මවන දඩයකට ඔහු යටත් විය යුතු ය.

15. (i) මෘත ශරීර ආදාහනය කිරීමට සුදුසු තත්ත්වයකින් ආදාහනාගාර නඩත්තු කිරීම සභාපතිවරයාගේ කර්තව්‍යය විය යුතු ය.

(ii) ආදාහනාගාරයක් නඩත්තු කිරීම හෝ ප්‍රතිසංස්කරණය කිරීම සඳහා කිසියම් කාලයක් තුළ වසා තබනු ලබන්නේ නම් ඒ පිළිබඳ නිවේදනය ආදාහනාගාරයේ ප්‍රකටව පෙනෙන ආකාරයට ප්‍රදර්ශනය කරවීම සභාපතිවරයාගේ කර්තව්‍යය විය යුතු ය.

16. මෘත ශරීර ආදාහනය කිරීම සඳහා අයකරගත යුතු ගාස්තු ප්‍රාදේශීය සභාවේ යෝජනා සම්මුතියක් මගින් කලින් කලට පනවනු ලැබිය හැකි වන්නේය. එසේ පනවනු ලබන ගාස්තු ප්‍රාදේශීය සභාව අවශ්‍ය යැයි සළකනු ලැබූ අවස්ථාවලදී සංශෝධනය කළ හැකිය.

17. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස -

"සභාව" යන්නෙන් අත්තනගල්ල ප්‍රාදේශීය සභාව අදහස් වේ.

"සභාපති" යන්නෙන් සභාපතිවරයාගේ ප්‍රාදේශීය සභාවේ බලතල, කාර්යයන් හා කර්තව්‍යයන් ඉටුකිරීම සඳහා යම් ලිඛිත නීතියක් මගින් හෝ ඒ යටතේ බලය පවරනු ලැබ ඇති තැනැත්තෙකුද, ඇතුළත් වේ.

"ආදාහනාගාර භාරකරු" යන්නෙන් සභාව සතු ආදාහනාගාරයක භාරකරු ලෙස කටයුතු කිරීම සඳහා පත්කර ඇති තැනැත්තෙකු ද අදහස් වේ.

"මෘත ශරීරය" යන්නෙන් මනුෂ්‍යයකුගේ මෘත ශරීරය හෝ මෘත ශරීරයකින් කොටසක් හෝ අජීවී උපතකින් බිහිකරන ලද සිරුරක්ද ඇතුළත් වේ.

*"අ" උපලේඛනය*

*අත්තනගල්ල ප්‍රාදේශීය ආදාහනාගාරයේ මෘත ශරීරය ආදාහනය කිරීම සඳහා ඉල්ලුම්පත්‍රය*

01. අයදුම්කරුගේ සම්පූර්ණ නම :——— .
ලිපිනය :——— .
ජාතික හැඳුනුම්පත් අංකය :——— .
ග්‍රාම සේවා කොට්ඨාසය :——— .

02. මියගිය තැනැත්තාගේ නම :——— .
පදිංචිව සිටි ලිපිනය :——— .
ග්‍රාම සේවා කොට්ඨාසය :——— .
ජාතික හැඳුනුම්පත් අංකය :——— .

03. මියගිය තැනැත්තාට ඉල්ලුම්කරුගේ සම්බන්ධය :——— .

04. මරණ සහතිකයේ අංකය හා දිනය :——— .

05. මරණ ලියාපදිංචි කළ ලේකම්ගේ නම හා ලිපිනය :——— .

06. මරණය සිදු වූ ආකාරය :——— .

07. මරණය සම්බන්ධයෙන් පරීක්ෂණයක් පවත්වන ලද්දේ නම් දිනය හා වේලාව :——— .

08. පරීක්ෂණ නිලධාරියාගේ නම හා තරාතිරම :——— .

09. පරීක්ෂණ නිලධාරියාගේ නිගමනය :——— .

10. මෘත ශරීරය ආදාහනය කිරීමට අවසර ලබා දෙන්නේ ද යන වග :——— .

11. ආදාහනය කිරීමට අවශ්‍ය දිනය හා වේලාව :——— .

ඉහත සඳහන් කර ඇති තොරතුරු සියල්ල නිවැරදි හා සත්‍ය බව සහතික කරමි. අදාළ සහතික අමුණා ඇත.

..............................................
අයදුම්කරුගේ අත්සන හා දිනය.

12-719

**කඩුවෙල මහා නගර සභාව**

අතුරු ව්‍යවස්ථා

252 වන අධිකාරය වන නගර සභා ආඥාපනතේ 267 වන වගන්තියේ (1) වන උපවගන්තිය සමඟ කියවිය යුතු, එකී ආඥාපනතේ 272 වන වගන්තියේ (32) වන උපවගන්තියෙන් මහා නගර සභාවලට ලැබී ඇති බලතල අනුව, කඩුවෙල මහා නගර සභාව විසින් සාදන ලද පහත දැක්වෙන අතුරු ව්‍යවස්ථා, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තියේ (1) වන උපවගන්තිය සමඟ කියවිය යුතු, ඉහත කී මහා නගර සභා ආඥාපනතේ 268 වන වගන්තියේ (1) වන උපවගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ පළාත් පාලන විෂය භාර අමාත්‍ය, ප්‍රසන්න රණතුංග වන මා විසින් අනුමත කරනු ලැබූ බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ප්‍රසන්න රණතුංග,
ප්‍රධාන අමාත්‍ය සහ පළාත් පාලන විෂයභාර අමාත්‍ය
බස්නාහිර පළාත.

2012 නොවැම්බර් මස 28 වන දින,
කොළඹ 07,
ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවතේ,
ශ්‍රාවස්ති මන්දිරයේ දී ය.

**අතුරු ව්‍යවස්ථා**

***කඩුවෙල මහා නගර සභා බල ප්‍රදේශය තුළ කුලී ත්‍රිරෝද රථ නවතා තැබීම***

1. මේ අතුරු ව්‍යවස්ථා කඩුවෙල මහා නගර සභා බල ප්‍රදේශය තුළ කුලී ත්‍රිරෝද රථ නවතා තැබීම විධිමත් කිරීම, පාලනය කිරීම සහ ගාස්තු අය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (i) (මෙහි මින්මතු "පාලන කමිටුව" යනුවෙන් හඳුන්වනු ලබන) පළමුවන උපලේඛනයේ I වන කොටසේ සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත, කඩුවෙල මහා නගර සභා බල ප්‍රදේශයේ රථ වාහන පාලනය කිරීම පිළිබඳ කමිටුවක් විය යුතු ය.

(ii) අවම වශයෙන් සෑම මාස තුනකට වරක් පාලන කමිටුවේ රැස්වීමක් බැගින් පැවැත්විය යුතු අතර, නගරාධිපතිවරයා උචිත යයි අදහස් කරන කවර හෝ අවස්ථාවක, පාලන කමිටුවේ විශේෂ රැස්වීම් පැවැත්විය හැකි ය.

(iii) ඉරිදා සහ රජයේ නිවාඩු දින හැර, අවම වශයෙන් දින හතරකටවත් කලින්, පාලන කමිටුවේ රැස්වීමේ දී සාකච්ඡා කිරීමට නියමිත කාරණා ඇතුළත් න්‍යාය පත්‍රයක් පාලන කමිටුවේ සාමාජිකයන් වෙත ලැබෙන්නට සැලැස්වීම නගරාධිපතිවරයාගේ කාර්යය විය යුතු ය.

(iv) පාලන කමිටුවේ රැස්වීම්වලදී ගනු ලැබූ තීරණ පිළිබඳ වාර්තා තබාගත යුතු අතර, එකී පාලන කමිටුවේ නිර්දේශයන් සඳහා සභාවේ අනුමැතිය ලබාගත යුතු ය.

(v) පාලන කමිටුවේ සනපූරණය සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකක් විය යුතු ය.

(vi) පළමුවන උපලේඛනයේ II වැනි කොටසේ සඳහන් කාර්යය, පාලන කමිටුවේ කාර්යය විය යුතු ය.

(vii) පාලන කමිටුවේ රැස්වීම්වල මූලාසනය නගරාධිපතිවරයා විසින් දැරිය යුතු ය.

(viii) මහා නගර සභාවේ ලේකම්වරයා කමිටුවේ ලේකම් විය යුතු ය.

3. (i) මේ අතුරු ව්‍යවස්ථාවල දෙවන උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් ස්ථාන (මෙහි මින්මතු "නැවතුම් ස්ථාන" යනුවෙන් හඳුන්වනු ලබන) කුලී ත්‍රිරෝද රථ නැවතුම් ස්ථාන වශයෙන් භාවිත කිරීමට ඉඩ දීමටත්, එකී උපලේඛනයේ II වැනි තීරුවේ, එක් එක් නැවතුම් ස්ථානය ඉදිරියෙන් සඳහන් උපරිම සංඛ්‍යාවට සමාන කුලී ත්‍රිරෝද රථ සංඛ්‍යාවක්, අදාළ නැවතුම් ස්ථානයේ නවතා තැබීමට ඉඩ දීමත් නීත්‍යානුකූල විය යුතු ය.

(ii) පාලන කමිටුවේ නිර්දේශයන්ට යටත්ව, යෝජනා සම්මතයක් මගින් දෙවන උපලේඛනයේ I වැනි තීරුවේ සඳහන් නැවතුම් ස්ථාන සහ II වැනි තීරුවේ සඳහන් උපරිම සංඛ්‍යාව වෙනස් කිරීම හෝ සංශෝධනය කිරීම හෝ ඉවත් කිරීම හෝ සභාව විසින් කලින් කල කරනු ලැබිය හැකි ය.

(iii) දෙවන උපලේඛනයට සභාව විසින් කලින් කල කරනු ලබන වෙනස් කිරීම් හෝ සංශෝධනය කිරීම් හෝ ඉවත් කිරීම් හෝ ගැසට් පත්‍රයේ නිවේදනය කළ යුතු අතර, එකී නිවේදනය ගැසට් පත්‍රයේ පළවූ දින සිට හෝ එකී නිවේදනයේ නිශ්චිතව සඳහන් කරනු ලබන ඉදිරි දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(iv) එක් එක් නැවතුම් ස්ථානයෙහි නවතා තැබිය හැකි උපරිම කුලී ත්‍රීරෝද රථ සංඛ්‍යාව, අදාළ නැවතුම් ස්ථානයේ පැහැදිලිව පෙනෙන ආකාරයේ දැන්වීම් පුවරුවක් භාෂාත්‍රයෙන් ප්‍රදර්ශනය කර තැබීම නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය.

(v) එක් එක් නැවතුම් ස්ථානයෙහි නවතා තබන කුලී ත්‍රීරෝද රථ, නවතා තබන පිළිවෙල පාලන කමිටුව විසින් කලින් කල තීරණය කරනු ලැබිය හැකි ය. පාලන කමිටුව විසින් තීරණය කරනු ලබන නවතා තැබීමේ පිළිවෙල පෙන්නුම් කරන ඉඩකඩ වෙන් කිරීම, පළල අඟල් හතරක් වූ සුදු හෝ කහ පැහැති රේඛා මගින් සලකුණු කිරීම නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය.

4. (i) නාගරික කොමසාරිස්වරයා විසින් හෝ බලයලත් නිලධාරියෙකු විසින් නිකුත් කරනු ලැබූ වලංගු අවසර පත්‍රයක් නොමැතිව කිසිදු නැවතුම් ස්ථානයක කුලී ත්‍රීරෝද රථයක් නවතා තැබීම නොකළ යුතු ය.

(ii) කිසියම් කුලී ත්‍රීරෝද රථයක් වෙනුවෙන් නිකුත් කළ අවසර පත්‍රයේ නිශ්චිතව සඳහන් නැවතුම් ස්ථානයේ හැර, වෙනත් කවර හෝ නැවතුම් ස්ථානයක නවතා තැබීම නොකළ යුතු ය.

(iii) කිසියම් කුලී ත්‍රීරෝද රථයක් කුලී ගමනක් අපේක්ෂාවෙන් නැවතුම් ස්ථානයක් නොවන ප්‍රසිද්ධ ස්ථානයක නවතා තැබීම නොකළ යුතු ය.

(iv) වෙනත් කවර හෝ මෝටර් වාහනයක් හෝ මෝටර් වාහනයක් නොවන වෙනත් වාහනයක් කවර හෝ නැවතුම් ස්ථානයක නවතා තැබීම වරදක් විය යුතු ය.

5. (i) කිසියම් නැවතුම් ස්ථානයක කුලී ත්‍රීරෝද රථයක් නවතා තැබීමට අදහස් කරන යම් නැතැත්තකු, මෙහි තුන්වන උපලේඛනයට සාරානුකූලව පිළියෙල කර නාගරික කොමසාරිස් විසින් නිකුත් කරනු ලබන අයදුම් පත්‍රයක්, ඒ මගින් ඉල්ලා ඇති ඇමුණුම් ද සමග ඉදිරිපත් කළ යුතු ය.

(ii) යෝජනා සම්මතයක් මගින් මහා නගර සභාව විසින් අයදුම්පත්‍ර ගාස්තුව කලින් කළ තීරණය කල හැකි ය. මහා නගර සභාව විසින් එසේ තීරණය කරනු ලබන අයදුම්පත්‍ර ගාස්තුව *ගැසට් පත්‍රයේ* නිවේදනය කළ යුතු අතර, එකී නිවේදනය *ගැසට් පත්‍රයේ* පළ වූ දින සිට හෝ එකී නිවේදනයේ නිශ්චිතව සඳහන් කරනු ලබන ඉදිරි දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(iii) කිසියම් අයදුම්කරුවකු විසින් අයදුම්පත්‍ර ගාස්තුව ගෙවා අයදුම්පත්‍රයක් ඉල්ලා සිටිනු ලැබූ විට නිකුත් කිරීමට ප්‍රමාණවත් අයදුම්පත්‍ර සූදානම් කර තැබීම නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය.

(iv) අවසර පත්‍රයක් ඉල්ලා නිවැරදිව සම්පූර්ණ කළ අයදුම්පත්‍රයක් ලැබීමෙන් අනතුරුව නාගරික කොමසාරිස්වරයා විසින් හෝ බලයලත් යම් නිලධාරියෙකු විසින් හෝ හතරවන උපලේඛනයේ I වැනි කොටසේ විධිවිධානවලට යටත්ව ඉල්ලුම් කර ඇති කාල සීමාවට, එනම් -

(අ) මාසිකව ;

(ආ) කාර්තු පදනමින් ;

(ඇ) වාර්ෂිකව.

හතරවන උපලේඛනයේ II වැනි කොටසට සාරානුකූලව පිළියෙල කළ අවසර පත්‍රයක් නිකුත් කරනු ලැබිය හැකි ය.

(v) මේ අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන යටතේ නිකුත් කරනු ලබන යම් අවසර පත්‍රයක් කලින් අවලංගු කරනු නොලැබුවහොත් මිස, එකී අවසර පත්‍රය -

(අ) මාසික අවසර පත්‍රයක් වනවිට, අදාළ මාසයේ අවසන් දිනය තෙක් ද ;

(ආ) කාර්තු පදනමෙන් නිකුත් කළ එකක් වන විට, අදාළ කාර්තුවේ අවසන් දිනය තෙක් ද ;

(ඇ) වාර්ෂික අවසර පත්‍රයක් වන විට, අදාළ වර්ෂයේ දෙසැම්බර් මස 31 වන දින තෙක් ද ;

වලංගු වන්නේ ය.

6. (i) මේ අතුරු ව්‍යවස්ථා යටතේ නිකුත් කරනු ලබන සෑම අවසර පත්‍රයක් ම මේ අතුරු ව්‍යවස්ථාවල පස්වන උපලේඛනයේ සඳහන් ගාස්තුවකට යටත් විය යුතු ය. අවසර පත්‍රයක් ලබා ගැනීමට ඉදිරිපත් කළ අයදුම්පත්‍රයකට අනුව අවසර පත්‍රයක් නිකුත් කිරීමට හැකියාව පවතින බව අයදුම්කරුට දැනුම් දීමෙන් පසු ඔහු විසින් පස්වන උපලේඛනයේ සඳහන් ගාස්තුව ගෙවීමෙන් අනතුරුව පමණක් අවසර පත්‍රය නිකුත් කළ යුතු ය.

(ii) යෝජනා සම්මතයක් මගින් කලින් කල පස්වන උපලේඛනයේ සඳහන් ගාස්තු සංශෝධනය කිරීමට මහා නගර සභාවට හැකි ය. එසේ කරනු ලබන සංශෝධනයන් ගැසට් පත්‍රයේ පළ වූ දින සිට හෝ එකී නිවේදනයේ නිශ්චිතව සඳහන් කර ඇති ඉදිරි දිනයක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(iii) නිකුත් කරනු ලබන අවසර පත්‍ර සම්බන්ධ තොරතුරු සටහන් කිරීමේ ලේඛනයක් පවත්වා ගැනීම නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය.

7. (i) කිසියම් නැවතුම් ස්ථානයකට ඇතුළුවන හෝ පිටවන කුලී ත්‍රීරෝද රථයකට බාධාවන ආකාරයෙන් කවර හෝ මෝටර් වාහනයක් හෝ මෝටර් වාහනයක් නොවන වෙනත් වාහනයක් නවතා තැබීම නොකළ යුතු ය.

(ii) කිසියම් කුලී ත්‍රීරෝද රථයක් නැවතුම් ස්ථානයෙන් ඉවත් කර ගැනීමේ කාර්යයට අදාළ යම් සුළු අලුත්වැඩියාවක් මිස වෙනත් කවර හෝ අලුත්වැඩියාවක් නැවතුම් ස්ථානය ඇතුළත නොකළ යුතු ය.

(iii) කවර හෝ තැනැත්තකු විසින් කිසියම් නැවතුම් ස්ථානයක කුලී ත්‍රීරෝද රථයක් හෝ වෙනත් කවර හෝ වර්ගයක මෝටර් වාහනයක් හෝ සේදීම හෝ සේදීමට සැලැස්වීම නොකළ යුතු ය.

(iv) අවසර පත්‍ර සහිත සෑම කුලී රථයක් ම නැවතුම් ස්ථානයක නවතා තබා ඇති අවස්ථාවක දී, -

(අ) එකී රථයේ භාරකරු ;
(ආ) කුලී ගමනක් යෑමට පැමිණෙන යම් තැනැත්තෙකු ;
(ඇ) එකී රථයේ සුළු අලුත්වැඩියාවකට ගෙන්වා ගනු ලබන කාර්මිකයෙකු හෝ ;
(ඈ) නාගරික කොමසාරිස්ගෙන් බලයලත් කිසියම් නිලධාරියෙකු ;

නොවන කවර හෝ තැනැත්තෙකු නැවතුම් ස්ථානයේ ගැවසීම නොකළ යුතු ය.

(v) කවර හෝ නැවතුම් ස්ථානයක කවර හෝ තැනැත්තෙකු විසින් විෂ මත්ද්‍රව්‍ය හෝ මත්පැන් හෝ භාවිත නොකළ යුතු අතර, දුරාචාරයේ හැසිරීම හෝ කවර හෝ පීඩාකාරී ක්‍රියාවක හෝ යෙදීම නොකළ යුතු ය.

(vi) සෑම අවසරපත්‍ර ලාභියකු විසින් ම තමා විසින් ලබාගත් අවසර පත්‍රය අදාළ කුලී ත්‍රීරෝද රථයේ ඉදිරිපස වීදුරුවේ පැහැදිලිව පෙනෙන ලෙස ප්‍රදර්ශනය කළ යුතු ය.

8. (i) කිසියම් අවසරපත්‍රධාරියකු විසින් මේ අතුරු ව්‍යවස්ථාවල කවර හෝ විධිවිධානයක් කඩකරනු ලැබ ඇති විටක හෝ උල්ලංඝනය කර ඇති විටක හෝ නාගරික කොමසාරිස්වරයා විසින් හෝ බලයලත් යම් නිලධාරියෙකු විසින් ඒ අවසරපත්‍රධාරියා වෙත නිකුත් කළ අවසර පත්‍රය හේතු දැක්වීමෙන් පසුව අවලංගු කරනු ලැබිය හැකි ය.

(ii) නාගරික කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධාරියෙකු හෝ යම් පොලිස් නිලධාරියෙකු හෝ ඉල්ලා සිටින ඕනෑම අවස්ථාවක භාරකරු විසින් අදාළ කුලී ත්‍රීරෝද රථය වෙනුවෙන් නිකුත් කළ අවසර පත්‍රය ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(iii) කිසියම් නැවතුම් ස්ථානයක නවතා තිබෙන කුලී ත්‍රීරෝද රථයක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ අවස්ථාවෝචිත කාරණයක් මත, නාගරික කොමසාරිස්වරයා විසින් හෝ බලයලත් නිලධාරියෙකු විසින් හෝ කිසියම් පොලිස් නිලධාරියෙකු විසින් හෝ හේතු දැක්වීමෙන් අනතුරුව එකී නැවතුම් ස්ථානයෙන් තාවකාලිකව ඉවත් කළ හැකි ය. මෙහිදී වලංගු අවසර පත්‍රයක් ලබා තිබීම එකී ඉවත් කිරීමට බාධාවක් නොවිය යුතු ය.

9. මේ අතුරු ව්‍යවස්ථා සතියේ සෑම දිනයකම 06.00 පැයේ සිට පස්වරු 20.00 පැය දක්වා බලපැවැත්විය යුතු ය.

10. මේ අතුරු ව්‍යවස්ථාවලින් නාගරික කොමසාරිස්වරයා වෙත පැවරී ඇති බලතල අතරින් එකක් හෝ කිහිපයක් හෝ සියල්ලම හෝ ඔහු විසින් කලින් කල මහා නගර සභාවේ යම් නිලධාරියෙකුට හෝ නිලධාරීන් කිහිප දෙනෙකුට හෝ පවරාදෙනු ලැබිය හැකි ය.

11. (i) මේ අතුරු ව්‍යවස්ථාවල කවර වූ හෝ විධිවිධානයක් කඩකිරීම හෝ උල්ලංඝනය කිරීම වරදක් වන අතර, නිසි බලය ඇති අධිකරණයක් මගින් වරදකට වරදකරු කරනු ලැබූ විට -

(අ) පළමුවන වරට කරනු ලැබූ වරදක් වන විට, රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට ;
(ආ) දෙවන වරට හෝ තදනන්තරව කරනු ලැබූ වරදක් වන විට, රුපියල් දෙදහසක් නොඉක්මවන දඩයකට ; සහ
(ඇ) නොකඩවා කෙරෙන වරදක් වන විට, වරදකරු කරනු ලැබීමකින් පසුව හෝ ඒ කඩ කිරීම සම්බන්ධයෙන්

අවධානය යොමු කරමින් නාගරික කොමසාරිස්වරයාගෙන් ලිඛිත දැන්වීමක් භාරදීමෙන් පසුව හෝ වරද නොකඩවා කෙරෙන සෑම දිනයක් සඳහා ම රුපියල් දෙසිය පනහක් නොඉක්මවන දඩයකට ;

යටත් විය යුතු ය.

(ii) අවසරපත්‍රධාරියකු හෝ භාරකරුවකු (i) ඡේදය යටතේ නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකට වරදකරු කරනු ලැබූ විටක අදාළ කුලී ත්‍රීරෝද රථය වෙනුවෙන් නිකුත් කළ අවසර පත්‍රය ද එනයින් ම අවලංගු විය යුතු ය.

(iii) (ii) ඡේදයේ හෝ 08 වැනි අතුරු ව්‍යවස්ථාවේ (i) ඡේදයේ සඳහන් ආකාරයට කිසියම් අවසර පත්‍රයක් අවලංගු වී ඇති අවස්ථාවක, අදාළ තැනැත්තාට නැවත අවසර පත්‍රයක් ඉල්ලා සිටීමට අයිතිවාසිකම තිබිය යුතු ය. නැවත අවසර පත්‍රයක් ඉල්ලා අයදුම්පත්‍රයක් ඉදිරිපත්කර ඇති විටක, ඒ අවස්ථාවේ ලැබී ඇති අයදුම්පත්‍ර සමග, එකී අයදුම්පත්‍රය ද සැලකිල්ලට ගැනීම නාගරික කොමසාරිස්වරයාගේ කාර්යය විය යුතු ය.

12. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස, මේ අතුරු ව්‍යවස්ථාවල -

"අවසරපත්‍රධාරියා" යන්නෙන්, මේ අතුරු ව්‍යවස්ථා යටතේ කිසියම් නැවතුම් ස්ථානයක, කුලී ත්‍රීරෝද රථයක් නවතා තැබීමට අවසර පත්‍රයක් ලබා ඇති තැනැත්තෙකු ද,

"අවසර පත්‍රය" යන්නෙන්, මේ අතුරු ව්‍යවස්ථා යටතේ කිසියම් නැවතුම් ස්ථානයක, කුලී ත්‍රීරෝද රථයක් නවතා තැබීමටත් නිකුත් කරනු ලැබූ අවසර පත්‍රයක් ද,

"උපරිම සංඛ්‍යාව" යන්නෙන්, 03 වන අතුරු ව්‍යවස්ථාව යටතේ කිසියම් නැවතුම් ස්ථානයක නවතා තැබිය හැකි යයි මහා නගර සභාව විසින් තීරණය කරනු ලැබ ඇති උපරිම කුලී ත්‍රීරෝද රථ සංඛ්‍යාව ද,

"කාර්තු පදනම" යන්නෙන්, කිසියම් නැවතුම් ස්ථානයක කුලී ත්‍රීරෝද රථයක් නවතා තැබීමට, යම් වර්ෂයක පළමුවන කාර්තුව එනම්, ජනවාරි මස 01 වැනි දින සිට මාර්තු මස 31 වන දින තෙක් හෝ දෙවන කාර්තුව එනම්, අප්‍රේල් මස 01 වන දින සිට ජූනි මස 30 වන දින තෙක් හෝ තෙවන කාර්තුව එනම්, ජූලි මස 01 වන දින සිට සැප්තැම්බර් මස 30 වන දින තෙක් හෝ සිව්වන කාර්තුව එනම්, ඔක්තෝබර් මස 01 වන දින සිට දෙසැම්බර් මස 31 වන දින තෙක් හෝ යන කිසියම් කාල පදනමක් ද,

"කුලී ත්‍රීරෝද රථය" යන්නෙන්, මගීන් හෝ භාණ්ඩ හෝ මගීන් සහ භාණ්ඩ හෝ කුලියට ප්‍රවාහනය කිරීමට යොදවාගනු ලබන, මෝටර් වාහන පනත යටතේ ලියාපදිංචි කර ඇති කිසියම් ත්‍රීරෝද රථයක් ද,

"නාගරික කොමසාරිස්වරයා" යන්නෙන්, කඩුවෙල මහා නගර සභාවේ නාගරික කොමසාරිස්වරයා හෝ ඔහුගේ බලතල, කාර්යය හා කර්තව්‍ය ඉටු කිරීමට තත් කාලයේ බලය පැවරී ඇති යම් තැනැත්තෙකු ද,

"නැවතුම් ස්ථානය" යන්නෙන්, මේ අතුරු ව්‍යවස්ථාවල 03 වන අතුරු ව්‍යවස්ථාව යටතේ මහා නගර සභාව විසින් කුලී ත්‍රීරෝද රථ නවතා තැබීමට වෙන්කර දෙනු ලැබූ ස්ථානයක් ද,

"පොලිස් නිලධාරියා" යන්නෙන්, 53 වන අධිකාරය වන පොලිස් ආඥාපනතේ පොලිස් නිලධාරියෙකු වශයෙන් අර්ථ නිරූපණය කර ඇති යම් තැනැත්තෙකු ද,

"ප්‍රසිද්ධ ස්ථානය" යන්නෙන්, මහා නගර සභා බල ප්‍රදේශය තුළ ඇති කිසියම් පොදු මාර්ගයක් හෝ කිසියම් පොදු මාර්ගයක මාර්ග රක්ෂිතය හෝ යම් පිට්ටනියක් හෝ යම් ඇලක් හෝ ගඟක් හෝ දිය පාරක් හෝ කිසියම් ඇලක, ගඟක හෝ දිය පාරක රක්ෂිතය හෝ කිසියම් රාජ්‍ය ආයතනයක් පිහිටි භූමිය හෝ මහා නගර සභාව සතු ඉඩමක් හෝ මහජනයා රැස්වන කිසියම් ස්ථානයක් ද,

"බල ප්‍රදේශය" යන්නෙන්, 252 වන අධිකාරය වන මහා නගර සභා ආඥාපනත යටතේ සංස්ථාපනය කළ කඩුවෙල මහා නගර සභාවේ බල ප්‍රදේශය ද,

"බලයලත් නිලධාරියා" යන්නෙන්, මේ අතුරු ව්‍යවස්ථාවල 10 වන අතුරු ව්‍යවස්ථාව යටතේ නාගරික කොමසාරිස්වරයා විසින් තත් කාර්යය සඳහා ලියවිල්ලකින් බලය පවරනු ලැබ ඇති කඩුවෙල මහා නගර සභාවේ යම් නිලධාරියෙකු ද,

"භාරකරු" යන්නෙන්, කිසියම් කුලී ත්‍රීරෝද රථයක් තමා විසින් ම කුලී ගමන් සඳහා යොදවන ලියාපදිංචි අයිතිකරු හෝ ලියාපදිංචි අයිතිකරුගේ කැමැත්ත ඇතිව යම් කුලී ත්‍රීරෝද රථයක් කුලී ගමන් සඳහා භාවිතා කරන වෙනත් යම් තැනැත්තෙකු ද,

"මහා නගර සභාව" යන්නෙන්, 252 වන අධිකාරය වන මහා නගර සභා ආඥාපනත යටතේ සංස්ථාපනය කරන ලද කඩුවෙල මහා නගර සභාව ද,

"මෝටර් වාහනය" යන්නෙන්, මෝටර් වාහන පනතේ ඊට දී ඇති අර්ථය ම ද,

"වෙනත් වාහනය" යන්නෙන්, මෝටර් වාහන පනතේ මෝටර් වාහනය යන්නට දී ඇති අර්ථයට ඇතුළත් නොවන, ඇන්ජිමකින් ක්‍රියාකරන වෙනත් ඕනෑම වාහනයක් ද,

අදහස් විය යුතු ය.

*පළමුවන උපලේඛනය*

**02 වන අතුරු ව්‍යවස්ථාව**

I වන කොටස -- පාලන කමිටුවේ සාමාජිකයන් විය යුතු තැනැත්තන්ගේ තනතුරු නාමලේඛනය ඃ

01. මහා නගර සභාවේ නගරාධිපතිවරයා. (කමිටු සභාපති)
02. මහා නගර සභාවේ නාගරික ඉංජිනේරු.
03. එක් එක් වර්ෂයේ පළමු වරට පවත්වනු ලබන මහා නගර සභාවේ සාමාන්‍ය රැස්වීමේ දී මහා නගර සභාවේ සභිකයන් අතුරින් යෝජනා සම්මතයකින් පත්කර ගනු ලබන සභිකයන් දෙදෙනෙකු.
04. මහා නගර සභාවේ ජ්‍යෙෂ්ඨ ආදායම් පරීක්ෂකවරයා.
05. මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා විසින් නම් කරනු ලබන එක් නියෝජිතයකු.
06. බස්නාහිර පළාතේ පළාත් බද මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපතිවරයා විසින් නම් කරනු ලබන එක් නියෝජිතයකු.
07. අතුරුගිරිය, නවගමුව සහ තලංගම යන එක් එක් පොලිස් ස්ථානයේ රථ වාහන අංශයේ ස්ථානාධිපතිවරයා හෝ ඔහු විසින් නම් කරනු ලබන එක් නියෝජිතයකු.
08. මහා නගර සභා බල ප්‍රදේශය තුළ ස්ථාපිත කර මහා නගර සභාවේ ලියාපදිංචි කර ඇති කුලී ත්‍රීරෝද රථ සංගම්වල සභාපතිවරුන්ගේ ඒකාබද්ධ රැස්වීමක දී එක් එක් දිස්ත්‍රික් කාර්යාල බල ප්‍රදේශයකට එක් සභිකයෙකු බැගින් නියෝජනය වන පරිදි නම් කරනු ලබන නියෝජිතයන් තිදෙනෙකු.

II වන කොටස -- පාලන කමිටුවේ කාර්යභාරය

* කුලී ත්‍රීරෝද රථ නැවතුම් ස්ථාන ඇති කිරීම හා පවත්වාගෙන යාම පිළිබඳ කරුණු පරික්ෂාකර, ඒ සම්බන්ධව සභාවට නිර්දේශ ඉදිරිපත් කිරීම.
* කුලී ත්‍රීරෝද රථ නැවතුම් ස්ථානවල නවතා තැබිය හැකි උපරිම රථ සංඛ්‍යාව සහ නවතා තැබීමේ පිළිවෙළ පිළිබඳ නිර්දේශයන් සභාවට ඉදිරිපත් කිරීම.
* මහා නගර සභා බල ප්‍රදේශය තුළ වාහන තදබදය පවතින ස්ථානවල පෞද්ගලික වාහන නැවතුම් ස්ථාන ඇති කිරීම හා පවත්වාගෙන යාම පිළිබඳ කරුණු පරික්ෂණාකර, ඒ සම්බන්ධ නිර්දේශයන් සභාවට ඉදිරිපත් කිරීම.

*දෙවන උපලේඛනය*

**03 වන අතුරු ව්‍යවස්ථාව**

කුලී ත්‍රීරෝද රථ නවතා තැබීමට වෙන්කළ ස්ථාන සහ ඒ එක් එක් ස්ථානයේ නවතා තැබීමට ඉඩ දෙනු ලබන උපරිම කුලී ත්‍රීරෝද රථ සංඛ්‍යාව.

| *I වන තීරුව* | *II වන තීරුව* |
|---|---|
| 01. ........................................................................ | ..................................... |
| 02. ........................................................................ | ..................................... |
| 03. ........................................................................ | ..................................... |
| 04. ........................................................................ | ..................................... |
| 05. ........................................................................ | ..................................... |

*තුන්වන උපලේඛනය*

**05 වන අතුරු ව්‍යවස්ථාව**

*නැවතුම් ස්ථානයක කුලී ත්‍රීරෝද රථයක් නවතා තැබීම සඳහා අවසර පත්‍රයක් ලබාගැනීම සඳහා ඉල්ලුම් පත්‍රය*

(අවසාන කොටස කඩා ඉවත්කර ඉල්ලුම්කරුට නිකුත් කිරීමට හැකිවන සේ මේ ආදර්ශය තනි කඩදාසියේ
දෙපැත්තේ පිළියෙල කරගත යුතු ය)

01. ඉල්ලුම්කරුගේ -

(i) සම්පූර්ණ නම :——— .
(ii) ස්ථිර පදිංචි ස්ථානයේ ලිපිනය :——— .
(iii) ස්ථිර පදිංචියට අදාළ පළාත් පාලන ආයතනය :——— .
(iv) ජාතික හැඳුනුම්පත්‍රයේ අංකය :——— . (හැඳුනුම්පත්‍රයේ ඡායා පිටපතක් අමුණන්න)
(v) වලංගු රියැදුරු බලපත්‍රයක් ඇත්නම්, එහි අංකය :——— .
(ත්‍රීරෝද රථය කුලී ගමන් සඳහා පැදවීම කරන්නේ ඉල්ලුම්කරු විසින් ම නම්, වලංගු රියැදුරු බලපත්‍රයේ ඡායා පිටපතක් අමුණන්න)

02. කුලී ත්‍රීරෝද රථය -

(i) ලියාපදිංචි කළ අංකය :——— . (වාහනයේ ලියාපදිංචි සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න)
(ii) කුලී ගමන් සඳහා පැදවීම කරන්නේ අයිතිකරු ද නැතහොත් වෙනත් තැනැත්තකු ද යන වග :——— .

03. කුලී ගමන් සඳහා ත්‍රීරෝද රථය පැදවීම කරන්නේ වෙනත් අයකු නම්, ඔහුගේ -

(i) සම්පූර්ණ නම :——— .
(ii) ස්ථිර පදිංචි ස්ථානයේ ලිපිනය :——— .
(iii) ජාතික හැඳුනුම්පත්‍රයේ අංකය :——— . (හැඳුනුම්පත්‍රයේ ඡායා පිටපතක් අමුණන්න)
(iv) වලංගු රියැදුරු බලපත්‍රයක් ඇත්නම්, එහි අංකය :——— . (බලපත්‍රයේ ඡායා පිටපතක් අමුණන්න)

04. ත්‍රීරෝද රථයේ දකුණු පස ඇතුළුවීමේ හා පිටවීමේ පහසුව අවුරා තිබේ ද? ඖව්/නැත.*

05. බලපත්‍රය ලබාගැනීමට අදහස් කරන නැවතුම් ස්ථාන කැමැත්තේ අනු පිළිවෙළ අනුව,

(i) ............................................................ (ii) ............................................................
(iii) ............................................................ (iv) ............................................................
(v) ............................................................ (vi) ............................................................

06. කලින් ලබාගත් අවසර පත්‍රයක් ඇත්නම්, එහි වලංගු කාලය ඉකුත් වන දිනය : 20 ............................

07. බලපත්‍රය ඉල්ලුම් කරන කාල පදනම: මාසික පදනම/කාර්තු පදනම / වාර්ෂික පදනම *.

08. කඩුවෙල මහා නගර සභා බල ප්‍රදේශය තුළ කුලී ත්‍රීරෝද රථ නවතා තැබීම විධිමත් කිරීම සහ පාලනය කිරීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා ම, විසින් හොඳින් කියවා බලන ලද බවත්, එකී අතුරු ව්‍යවස්ථාවල විධිවිධාන පිළිපැදීමට එකඟවන බවත්, එහි සඳහන් යම් විධිවිධානයක් ම, විසින් හෝ මාගේ කුලී ත්‍රීරෝද රථය පදවන්නා විසින් හෝ කඩ කළහොත් හෝ උල්ලංඝනය කළහොත් ඇතිවන ප්‍රතිවිපාක ම විසින් දන්නා බවත්, ඒ පිළිබඳව මාගේ කුලී ත්‍රීරෝද රථය පදවන්නාට අවබෝධකර දී ඇති බවත්, ප්‍රකාශ කරමි. එසේ ම, ඉහතින් සඳහන් කර ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, එකී යම් තොරතුරක් සාවද්‍ය බව තහවුරු වුවහොත්, මා වෙත අවසර පත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීමට නාගරික කොමසාරිස්වරයාට බලය ඇති බවත් සහ අවසර පත්‍රය නිකුත් කිරීමෙන් අනතුරුව එවැන්නක් තහවුරු වුවහොත් නිකුත් කළ බලපත්‍රය කිසිදු පූර්ව දැනුම් දීමකින් තොරව අවලංගු කිරීමට නාගරික කොමාසාරිස්වරයාට බලය ඇති බව මා දන්නා බවත් වැඩිදුරටත් ප්‍රකාශ කර සිටිමි.

දිනය : 20.................................... ......................................................
*අනවශ්‍ය වචන කපා ඉවත් කරන්න ඉල්ලුම්කරුගේ අත්සන

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා පමණි) *අනවශ්‍ය වචන කපා ඉවත් කරන්න.

ඉහත ඉල්ලුම්කරුට .................................................. නැවතුම් ස්ථානයේ අංක .................................... දරන ත්‍රීරෝද රථය නවතා තැබීම සඳහා මාසික පදනමෙන් /කාර්තු පදනමෙන් / වාර්ෂික පදනමෙන් * අවසර පත්‍රයක් නිකුත් කිරීම අනුමත කරමි/ ...................................................................................... හේතු මත බලපත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කරමි. *

දිනය : 20........................ ......................................................
නාගරික කොමසාරිස්.

අයකර ගත් මුදල: රුපියල් .................................................................. ලදු පත් අංකය :.................................................................
නිකුත් කළ අවසර පත්‍රයේ අංකය :..........................................................

දිනය : 20........................ ......................................................
දිස්ත්‍රික් නිලධාරි.

...................................................... දිස්ත්‍රික් කාර්යාලය.

කුලී ත්‍රීරෝද රථ අවසර පත්‍ර ලේඛනයේ ...................................... පිටුවේ අංක ................................ යටතේ සටහන් කළා.

දිනය : 20........................ ......................................................
විෂය භාර නිලධාරි.

---------------------------- ඉල්ලුම්පත්‍රය භාරගත් බව මෙතනින් වෙන්කර, ඉල්ලුම්කරුවෙත භාර දෙන්න ----------------------------------------

කුලී ත්‍රීරෝද රථ නැවතුම් ස්ථානයක, නවතා තැබීම පිණිස අංක ........................................................ දරන ත්‍රීරෝද රථයට අවසර පත්‍ර ලබා ගැනීමට ............................................................................................... මහත්මා/මහත්මිය/මෙනෙවිය විසින් ඉදිරිපත් කළ 20 ................................. දිනැති ඉල්ලුම් පත්‍රය භාර ගතිමි. (වේලාව පෙ.ව./ප.ව........................)

දිනය : 20........................

........................................................
දිස්ත්‍රික් නිලධාරි,
නාගරික කොමසාරිස් වෙනුවට.

*හතරවන උපලේඛනය*

**05 වන අතුරු ව්‍යවස්ථාව**

I වන කොටස - අවසර පත්‍ර නිකුත් කිරීමට අදාළ කොන්දේසි :

* ත්‍රීරෝද රථ නැවතුම් ස්ථානයක නවතා තැබීමට අවසර පත්‍ර නිකුත් කිරීමේ දී, ඒ අවස්ථාව වනවිට ලැබී ඇති අයදුම්පත්‍ර සියල්ල එකට ගෙන සලකා බැලීම කළ යුතු ය.
* අවසර පත්‍ර ලබා ගැනීමට ඉදිරිපත් කළ ඉල්ලුම් පත්‍රයේ ඉල්ලා ඇති තොරතුරු අදාළ ඇමුණුම් ද සමග නිවැරදිව ඉදිරිපත් කර නැති නම්, ප්‍රතික්ෂේප කළ යුතු ය.
* අවසර පත්‍ර ලබා දීමේ දී කිසියම් නැවතුම් ස්ථානයට ආසන්නතම පදිංචිකරුවන්ට ප්‍රමුඛතාව ලබා දිය යුතු ය.
* කිසියම් නැවතුම් ස්ථානයක් වෙනුවෙන් අවසර පත්‍රයක් නිකුත් කිරීමේ කාර්යයේ දී සමාන සුදුසුකම් ඇති කිහිප දෙනකු ඇතිවිට, ඉල්ලුම් පත්‍රය ඉදිරිපත් කළ දිනයේ ප්‍රමුඛතාව සැලකිල්ලට ගත යුතු ය.
* අවසර පත්‍රය ඉල්ලා සිටින කුලී ත්‍රීරෝද රථයේ දකුණු පසින්, මගීන්ට ඇතුල්වීමට හෝ පිටවීමට නොහැකි වන සේ ආවරණයක් සවි කර තිබිය යුතු ය.
* කුලී ත්‍රීරෝද රථයේ ලියාපදිංචි හිමිකරුගේ නමින් පමණක් අවසර පත්‍රය නිකුත් කළ යුතු ය.
* අවසර පත්‍රය අලුත්කරවා ගැනීමට අවශ්‍ය වන යම් තැනැත්තෙකු පවත්නා අවසර පත්‍රයේ වලංගු කාලය ඉකුත් වීමට දින 14ට මත්තෙන් ඉල්ලුම් පත්‍රයක් ඉදිරිපත් කළ යුතු ය.
* කිසියම් අවසර පත්‍රයක් අලුත්කරවා ගැනීමට ඉදිරිපත් කරන ඉල්ලුම් පත්‍රය, පවත්නා අවසර පත්‍රයේ වලංගු කාලය ඉකුත් වීමට දින 14 ට පෙර ඉදිරිපත් කර නොමැති නම්, ඒ අවස්ථාව වනවිට ලැබී ඇති නව ඉල්ලුම් පත්‍රයක් සේ සලකා අනෙකුත් ඉල්ලුම් පත්‍ර ද සමග සලකා බැලිය යුතු ය.

II වන කොටස - අවසර පත්‍රයේ ආකෘතිය

## කඩුවෙල මහා නගර සභාව

| | | |
|---|---|---|
| ලදුපත් අංකය: | ගාස්තුව: රු. | අවසර පත්‍ර අංකය: |
| பற்றுச்சீட்டு இலக்கம்: . . . . . . . . . | கட்டணம் ரூ. . . . . . . . . . . . . | அனுமதிப் பத்திர இலக்கம்: 000000 |
| Receipt No. | Charges: Rs. | Permit No. : |

கடுவெல மாநகர சபையின்

Kaduwela Municipal Council

### කුලී ත්‍රිරෝද රථ නැවතුම් ස්ථාන අවසර පත්‍රය
### வாடகை முச்சக்கர வண்டிகள் நிறுத்திவைக்கும் இடங்களுக்கான அனுமதிப் பத்திரம்
### Permit for parking of Three Wheeler

නැවතුම් ස්ථානය:
நிறுத்திவைக்கும் இடம்: . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
Place of Parking

අවසරපත්‍රධාරියාගේ නම:
அனுமதிப் பத்திரதாரரின் பெயர்: . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
Permit Holder's name:

රථය පදවන්නාගේ නම:
வண்டி ஓட்டுநரின் பெயர்: . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . . .
Name of the Driver:

වලංගු කාලය: from. . . . . . . . . . . . . . . . . . . . සිට இருந்து
செல்லுபடியாகும் காலம்:
Date of validation to . . . . . . . . . . . . . . . . . . . . . තෙක් வரை

දිනය:
திகதி 20 . . . . . . . . . . .
Date

නාගරික කොමසාරිස් மாநகர சபை ஆணையாளர்
Municipal Commissioner
කඩුවෙල මහා නගර සභාව கடுவெல மாநகர சபை
Kaduwela Municipal Council

(සෙන්ටිමීටර 13 ක සමචතුරශ්‍රයක අවසරපත්‍රය පිළියෙල කරගත යුතුය)

*පස්වන උපලේඛනය*

**06 වන අතුරු ව්‍යවස්ථාව**

*අවසර පත්‍ර ගාස්තු උපලේඛනය*

| නැවතුම් ස්ථානය | බලපත්‍ර ගාස්තුව | | |
|---|---|---|---|
| | මාසික | ත්‍රෛමාසික | වාර්ෂික |
| 01. ........................................................................ | රු...................... | රු...................... | රු...................... |
| 02. ........................................................................ | රු...................... | රු...................... | රු...................... |
| 03. ........................................................................ | රු...................... | රු...................... | රු...................... |
| 04. ........................................................................ | රු...................... | රු...................... | රු...................... |
| 05. ........................................................................ | රු...................... | රු...................... | රු...................... |

12-720

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.